# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2006 අංක 14 දරන ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 2006 මාර්තු මස 31 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2006 මාර්තු මස 31 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
ගැසට් පත්‍රයේ **II** වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : රු. **5.50** යි. තැපැල් ගාස්තුව : රු. **5.00** යි.

## 2006 අංක 14 දරන ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2006 මාර්තු මස 31 වන දින]

එල්.ඩී.—ඕ. 8/2006.

## 1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2006 අංක 14 දරන ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

2. 2005 අංක 9 දරන පනතින් අවසන් වරට සංශෝධිත 1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු පනතේ උපලේඛනය, එහි 1 වන කොටස ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :— — 1988 අංක 40 දරන පනතේ උපලේඛනය සංශෝධනය කිරීම.

"I වන කොටස

බුකිකරුවකු ලෙස ව්‍යාපාරය කරගෙන යන තැනැත්තකු විසින් මෙහි I වන තීරුවේ නිශ්චිතව සඳහන් සෑම වර්ෂයක් සඳහා ම, ගෙවිය යුතු බදු මුදල් ප්‍රමාණය මෙහි II වන තීරුවේ අනුරූප සටහනෙහි නිශ්චිතව සඳහන් මුදල හා සමාන මුදලක් විය යුතු ය.

| *I වන තීරුව*<br>*වර්ෂය* | *II වන තීරුව*<br>*බදු මුදල් ප්‍රමාණය* |
|---|---|
| 1. 1988 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 2001 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන සෑම වර්ෂයක් ම සඳහා | රුපියල් එක් ලක්ෂයක් |
| 2. 2001 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 2002 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන සෑම වර්ෂයක් ම සඳහා | රුපියල් මිලියන එකක් |

2-PL 001061- 4,500 (2006/03)

| | |
|---|---|
| 3. 2002 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 2005 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන සෑම වර්ෂයක් ම සඳහා— | |
| (i) ව්‍යාපාරය පවත්වාගෙන යාමේ දී සජීවී රූපවාහිනී විකාශන පහසුකම් භාවිත කරන අවස්ථාවක | රුපියල් තිස් දහසක් |
| (ii) ව්‍යාපාරය පවත්වාගෙන යාමේ දී සජීවී රූපවාහිනී විකාශන පහසුකම් භාවිත නොකරන අවස්ථාවක | රුපියල් දසදහසක් |
| 4. 2005 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 2006 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භවන සෑම වර්ෂයක් ම සඳහා, ඔට්ටු ඇල්ලීමේ ව්‍යාපාරය— | |
| (i) අනුයෝජිතයන් මාර්ගයෙන් කරනු ලබන විට | රුපියල් මිලියන එකක් |
| (ii) සජීවී රූපවාහිනී විකාශන පහසුකම් භාවිත කර පවත්වාගෙන යනු ලබන අවස්ථාවක | රුපියල් දෙලක්ෂ පනස් දහසක් |
| (iii) සජීවී රූපවාහිනී විකාශන පහසුකම් භාවිත නොකර පවත්වාගෙන යනු ලබන අවස්ථාවක | රුපියල් විසිපන්දහසක් |

5. 2006 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන සෑම වර්ෂයක් ම සඳහා ඔට්ටු ඇල්ලීමේ ව්‍යාපාරය–

| | | |
|---|---|---|
| (i) | අනුයෝජිතයන් මාර්ගයෙන් කරනු ලබන විට | රුපියල් මිලියන එකක් |
| (ii) | සජීවී රූපවාහිනී විකාශන පහසුකම් භාවිත කර පවත්වාගෙන යනු ලබන අවස්ථාවක | රුපියල් තුන් ලක්ෂයක් |
| (iii) | සජීවී රූපවාහිනී විකාශන පහසුකම් භාවිත නොකර පවත්වාගෙන යනු ලබන අවස්ථාවක | රුපියල් පනස් දහසක්”. |

**3**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.